පින්බිමක් රමණීය වනබිමක් කිරීමට පැමිණි හංගේරියානු සංචාරකයෝ

දුම්වැටි නිසා වසරකට මෙරට පුරවැසියන් 20,000කට අධික පිරිසක් මියයති

2024 අයවැය කාරක සභා අවස්ථා විවාදයේ 12වන දිනය සඳහා වන විවාදය ඊයේ (04දා) පැවැත්වුණි. එහිදී අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වුණු අතර, එහිදී පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු මෙලෙස අදහස් පළ කළහ.



2024 අයවැය කාරක සභා අවස්ථා විවාදය

12වැනි දිනය

නිදහස් අධ්‍යාපනය නූතනවාදී මෙන්ම යාවත්කාලීන කරන්න ඕන

විපක්ෂනායක සජිත් ප්‍රේමදාස

වර්තමානයේ වෘත්තීය පුහුණු අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය අඩු වෙලා තියෙනවා. දළ වශයෙන් 250,000ක් පමණ උසස් පෙළ විභාගයට මුහුණ දීලා, එයින් 15-20%ත් අතර ප්‍රමාණයක් රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළු වෙනවා. තවත් 08-10%ත් අතර ප්‍රමාණයක් පෞද්ගලික විශ්වවිද්‍යාලවලට යනවා. සමහර පෞද්ගලික විශ්විද්‍යාලවල ගුණාත්මකභාවය ගැන ගැටලු තිබෙනවා. ඒත් ඉතිරි 70%ට උසස් අධ්‍යාපන අවස්ථා අහිමි වෙනවා. පැහැදිලිවම අපි එක දෙයක් අවබෝධ කරගන්න ඕන. නිදහස් අධ්‍යාපනය නූතනවාදී කරන්න ඕන. යාවත්කාලීන කරන්න ඕන. එය ශක්තිමත් කරන්න ඕන.

අපේ රටේ විශ්වවිද්‍යාල වරම් නොලබන 70%කට අධ්‍යාපනයේ අවස්ථාව අපි ලබාදෙන්න ඕන. සමහරු මේ සිසු පරපුරට අවස්ථාව, විකල්ප ලබාදෙනවාට විරුද්ධ වෙනවා. එසේ විරුද්ධ වෙමින්, රාජ්‍ය අධ්‍යපන පද්ධතිය සකස් කරමින් අවස්ථා ලබාදීම උදෙසා පෞද්ගලික අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇතුල් වීමේ ඉඩකඩ නතර කරමින්, තමන්ගේ දුවා දරුවන්ව යවනවා පෞද්ගලික අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අධ්‍යාපනය ලබන්න. කිසිසේත්ම අපි ඒකට විරුද්ධ වෙන්නේ නැහැ. මම අහන්න කැමතියි තමන්ගේ දුවා දරුවාව පෞද්ගලික විශ්වවිද්‍යාලවලට යවන්න හොඳ නම්, පෞද්ගලික අධ්‍යාපන ආයතනවලට යවන්න හොඳ නම්, ඇයි රටේ දරුවන්ට ඒ විකල්පය හොඳ නැත්තේ? මහ පාරට බැහැලා උද්ඝෝෂණ කරන එක හරිද? සමගි ජනබලවේගයේ ප්‍රතිපත්තිය නම් රාජ්‍ය නිදහස් නිවහල් අධ්‍යාපනය ශක්තිමත් කිරීම.

නව බඳවාගැනීම් හරහා විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ හිඟයට විසඳුම් ලබාදෙනවා

අධ්‍යාපන අමාත්‍ය, සභානායක සුසිල් ප්‍රේමජයන්ත්

විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් 12,000ක් ඉන්න ඕන. දැන් ඉන්නේ 9,000යි. දැන් මම ...

... බඳවාගන්න අවසර අරන් දුන්නා. ලබන අවුරුද්දට ඉතිරි දෙදහස් ගාණම බඳවා ගන්නට අවශ්‍ය කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරනවා. විෂය වර්ග අනුව, විශ්වවිද්‍යාල 17ටම මම හිතනවා විශාල ප්‍රමාණයක් බඳවාගන්න පුළුවන් වෙයි කියලා. ඒ වගේම කියන්න ඕන වතු පාසල් 864ක් තියෙනවා. ගුරුවරු ඉන්නවා 13,541ක්. දරුවෝ ඉන්නවා 212, 265ක්. අපි 2,535ක් වතුවලින්ම බඳවාගන්න කටයුතු කරනවා.

නව ව්‍යාපෘති කරන්න පෙර පවතින අඩුපාඩු විසඳිය යුතුයි

සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ඉම්තියාස් බාකීර් මාකර්

අපේ විශ්වවිද්‍යාල ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වලින් ඉහළට ගැනීමට නම්, ඉහල තත්ත්වයකට ගෙන එන්නට නම්, අලුත් සිතීම්වලට අප යා යුතු වෙනවා. අවශ්‍ය පහසුකම් ආදිය ලබාදීම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ගිය වසරේ අලුත් විශ්වවිද්‍යාල ඇති කරන යෝජනා තිබුණා. ජනාධිපතිවරයාගේ කතාවෙන්. අලුතින් වෛද්‍ය පීඨ ඇති කරන යෝජනා තිබුණා. මෙවැනි අලුත්, නම පවතින ව්‍යාපෘති කරන්නට පෙර පවතින විශ්වවිද්‍යාලවල, පවතින පීඨයන්වල ඇති අඩුපාඩු සපුරා ගැනීමට ප්‍රමුඛතාව දිය යුතු වෙනවා. ...

... හෘදසාක්ෂිය දන්නවා.

පෙරපාසල් ගුරුවරුන්ට නියමානුකූල පුහුණුවක් ලබාදෙන්න

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.බී. දිසානායක

අපේ රටේ ප්‍රාථමික අධ්‍යාපනය ගැන විශේෂ අවධානය යොමු කරන්න. කිසිදු පුහුණුවක් නැතිව ප්‍රාථමික පාසල්, පෙරපාසල් කරන ගුරුවරු ගැන සඳහන් වුණා. පළමුවෙන්ම මේ ගුරුවරු ඉතා ඉක්මනින් නියමානුකූල පුහුණුවකට සති අන්තයේ හරි පන්ති තියලා යොමු කරවන්න. එහෙම කරලා ප්‍රාථමික අධ්‍යාපනය කියන මේ පුංචි දරුවන්ට තියෙන අනතුරෙන් මේ ළමුන්ව ගලවා ගන්න. අපේ රටේ තියෙන පාසල් 10,167ක ලක්ෂ 42ක් දරුවෝ ඉගෙන ගන්නවා. ඒ වගේම පෞද්ගලික හා ජාත්‍යන්තර පාසල්වල 179,000ක් දරුවෝ ගිය අවුරුද්දේ ඉගෙන ගෙන තිබෙනවා.

මේ 10,167න් 399ක් තියෙනවා ජාතික පාසල්. ඒකෙන් පාසල් 200ක තත්ත්වය ඉතාම ශෝචනීයයි. මේක තමයි ඇත්ත. මේ පාසල් 200 කලා අංශයෙන් උසස් පෙළ තියෙනවා ඇරෙන්න අනිත් විෂයන්වලින් උසස් පෙළ තියන්නේ නැහැ. ...

ගෝඨාභය ජනාධිපතිවරයාගේ කාලයේ නම් කළ ජාතික පාසල් ගේට්ටුවට සහ නාමපුවරුවට පමණක් සීමා වෙලා

පාර්ලිමේන්තු මන්ත්‍රී චන්දිම වීරක්කොඩි

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේ වැඩි වඩින්න තරම් ජාතික පාසල් නම් කළා. කනගාටුවට කාරණය තමයි ඒ ජාතික පාසල් සීමා වෙලා තියෙන්නේ ගේට්ටුවටයි, බෝඩ් එකටයි විතරයි. ජාතික පාසල් ප්‍රමාණය වැඩි කරන්න විශාල මුදලක් වෙන් කළා. ඒ පාසලකට අවශ්‍ය කරන පරිගණක ටික, අනෙකුත් අවශ්‍ය කරන සම්පත් ලබාදෙන්නේ නැතිව ගේට්ටුවකුයි, විශාල බෝඩ් එකකුයි ගැහුවා. අපි විශ්වාස කරනවා, අපි බලාපොරොත්තු වෙනවා ඒ වගේ කටයුතු ඉදිරියට නොකරයි කියලා.

ළමුන්ට විශාල බරක් වී තිබෙන 5 ශිෂ්‍යත්ව විභාගය අහෝසි කරන්න ඕන

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

ලෝකයේ දියුණු රටවල තියෙන ආකාරයට මේ 5 වසර ශිෂ්‍යත්වය අහෝසි කළ ...

... විභාගයක්වත් නැහැ. 08 වසරේදී තමයි ළමයි වර්ග කිරීමක් කරන්න ගන්නේ. ඒ අනුව තමයි වර්ග කරලා එක් එක් ක්ෂේත්‍රවලට යවන්නේ. ළමයෙක් පාසලට ඇතුළු කරපු දවසේ ඉඳලා එක පැත්තකින් 05 ශිෂ්‍යත්වය සඳහා දුක් විඳිනවා. අනෙක් පැත්තෙන් 05 ශිෂ්‍යත්වය අසමත් වුණාම ඇතැම් දෙමව්පියෝ ඒ දරුවන්ට හිරිහැර කරනවා. මේ දරුවන්ට වෙලා තියෙන විශාල බරක් මේ 05 ශිෂ්‍යත්වය.

ඉංග්‍රීසි අධ්‍යාපනය ඉහළ නැංවීමට රුපියල් මිලියන 500ක් වෙන් කළත්, එය රුපියල් බිලියන 500ක් වටිනා වැඩපිළිවෙළක්

රාජ්‍ය අමාත්‍ය පියල් නිශාන්ත ද සිල්වා

රටක් විදියට අපිට වැරදුණා. ඒ වෙලාවේ අපි හරියට කල්පනා කළා නම් ඇත්තටම අවුල අපිට තේරෙන්න ඕන. මේ රටේ හොරු, මෝඩයෝ, දූෂිතයෝ විතරක් නෙවෙයි දේශපාලඥයන්, විද්වත් පුරවැසියන් පවා නිර්මාණය වුණේ පැවති අධ්‍යාපන ක්‍රමවේදයේ ප්‍රතිඵලයක් විදියටයි. අධ්‍යාපනය නිදහස් කියලා අපි උදම් ඇනුවත් ඒ හරහා අද වනතුරු රටට අවශ්‍ය සාධනීය පුරවැසියන් නිර්මාණය කරන්න බැරි වුණා. ඒ වගේම මෙවර අයවැයෙන් 2024 වසරේ සිට 2034 වසර දක්වා ක්‍රියාත්මක ඉංග්‍රීසි භාෂා ඉහළනැංවීමේ වැඩසටහන සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කරලා තියෙනවා. මම හිතන්නේ මේක රුපියල් මිලියන 500ක වටිනාකමක් නෙවෙයි, මෙය රුපියල් බිලියන 500කට වැඩිය වටින වැඩපිළිවෙළක්.

වසර 12ක් දක්වා පාසල් අධ්‍යාපනය අඩු කිරීමට අපි එකඟයි, ඒත් ගැටලු නිරාකරණය කරන්න

පාර්ලිමේන්තු මන්ත්‍රී ගෙවිඳු කුමාරතුංග

ඇතැම් විසංවාදාත්මක තොරතුරු ඉදිරිපත් වීම තුළ මේ සම්පූර්ණ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විහිළුවක් බවට පත්වීමේ ඉඩකඩක් තියෙනවා. පසුගියදා පැවති සාකච්ඡාවකින් පසුව අද අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ෆේස්බුක් එකට ඇතුළත් කරලා තියෙනවා සාමාන්‍ය පෙළ විභාගය 10 ශ්‍රේණියේදී පවත්වනවා, පාසල් අධ්‍යාපනය වසර 12කට සීමා කරනවා කියලා. සාමාන්‍ය පෙළ විභාගය 10ට ගැනීම සම්බන්ධයෙන් වගේම වසර 12ට අධ්‍යාපනය ගැනීම සම්බන්ධයෙන් අපි එකඟයි.

ළමයෙකුගේ සිතුම් පැතුම්, නිරවුල් චින්තනය ආදිය ගොඩනැගෙන්නේ තමාගේ මව් භාෂාව මුල් කරගෙන. අද අපි දකිනවා සිංහල භාෂාව ඉගැන්වීමේදී මූලික ව්‍යාකරණ නිසි පරිදි ඉගැන්වෙන්නේ නැතිනම්, මව් භාෂාවෙන් කළ යුතු සන්නිවේදනය නිසි පරිදි කෙරෙන්නේ නැති නිසා මේ රට මේ තත්ත්වයට පත් වුණා කියලා තමයි අපේ අදහස. බොහෝදුරට අද ගුරුවරුන්ගෙන් ...

අද CARTOON



මරණයේ රමණීය නිමැයුමක් වූ අපූරු සුසාන භූමිය

දරුණු කාලගුණය ලොව රෝහල් 12කින් 1ක් වසා දමාවිලු

වැඩිම අවදානම ඇත්තේ පහළ, මැදි ආදායම් සහිත රටවල රෝහල් වෙතයි

අග්නිදිග ආසියානු කලාපයේ රෝහල් 5කින් 1ක් අවදානමක

මෙම වාර්තාවේදී දකුණු ආසියානු කලාපය පිළිබඳ අධ්‍යයනයේදී ශ්‍රී ලංකාවේ රෝහල් 826ක් පිළිබඳ විශ්ලේෂණය කර ඇති අතර, වසර 2100 වනවිට ඉන් රෝහල් 86ක් එනම් 10.4%ක් පමණක් දරුණු කාලගුණික තත්ත්වයන් පිළිබඳ අවදානමට ලක්ව තිබෙන බව සඳහන්ව තිබේ.

Number of high risk hospitals and percentage increase in risk of damage to hospital infrastructure 2020-2100 at RCP 8.5



1 in 12 hospitals around the world will be at high risk of total or partial shutdown

under RCP 8.5 by 2100